**දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) - 2023**

---

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) 2016 අගෝස්තු 05 දින එළඹි ප්‍රදාන ගිවිසුමේ 17.01 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ව්‍යාපෘතියේ ප්‍රධාන ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.

දේශගුණික විපර්යාසවලට අවදානම සහ බලපෑම්වලට එරෙහිව ආහාර සුරක්ෂිතතාව, සෞඛ්‍ය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන් කාන්තාවන්ගේ ජීවන සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ දැක්මට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වියළි කලාපයේ ගංගා ද්‍රෝණි තුනක ග්‍රාමීය වාරිමාර්ග පද්ධතියේ ප්‍රත්‍යස්ථතාව වැඩිදියුණු කිරීම සහ දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම පුළුල් කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සුරක්ෂිත පානීය ජලය සඳහා වසර පුරා ප්‍රවේශය ලබා දීම සඳහා දේශගුණයට ඔරොත්තු දෙන විමධ්‍යගත ජල සැපයුම සහ කළමනාකරණ විසඳුම් වැඩිදියුණු කිරීම, කුඩා වතු හිමියන්ගේ ජල කළමනාකරණය සහ නියඟයට අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශගුණය සහ ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ පුරෝකථන පද්ධතිය ශක්තිමත් කිරීම සහ ගංවතුර සහ ව්‍යාපෘති කළමනාකරණය යන අංග හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රධාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,521.45 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 52.084 ක් වූ අතර එයින් රු. මිලියන 5,499.71 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 38.084 ක් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2021.74 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතිය 2017 ජූලි මස එහි කටයුතු ආරම්භ කර 2024 ජූනි මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය ව්‍යාවනය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් මතයක් ප්‍රකාශ නොකරමි. මගේ වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වෙතත්, මතය ප්‍රකාශනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

**පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හරිත දේශගුණික අරමුදල විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත පසුගිය වසර 07 තුළ රු. මිලියන 8,106 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 34.44 ක මුදලක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 3,074.30 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 12.99 ක් පමණක් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයට (MMDE) ලබා දී තිබූ අතර, රු.මිලියන 3,198.12 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 14.91 ක මුදලක් UNDP මගින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීමට වැය කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 1,618 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 6.55 ක ශේෂ අරමුදල UNDP විසින් රඳවා ගෙන තිබුණි. සම්පූර්ණ විසර්ජනයෙන් සියයට 38 ක් නියෝජනය කරන ක්‍රියාත්මක කිරීමේ ආයතනයට (MMDE) ලබා දී ඇති මුදල සඳහා පමණක් මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබූ බැවින්, සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්ය සාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබිඹු නොවූ අතර විගණන කටයුතු MMDE විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට සීමා විය. | FAA ව්‍යාපෘති ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය NIM (ජාතික ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට නම් කරන ලදී. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා වාරිමාර්ග අමාත්‍යාංශය (කලින් මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, MMDE ලෙස හැඳින්විණි) සහ UNDP අතර වෙනම ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. මෙම ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව, UNDP විසින් GCF වෙතින් ලැබුණු සියලුම අරමුදල් රජයේ භාණ්ඩාගාරයට යැවීම වෙනුවට ඔවුන්ගේ බැංකු ගිණුමේ රඳවාගෙන ඇත. එබැවින් PMU විසින් ඒ අනුව ක්‍රියා පටිපාටිය අනුගමනය කර ඇති අතර PMU විසින් සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් වලට අනුකූලව වාර්ෂික රාජ්‍ය ඇස්තමේන්තු වල ප්‍රතිපාදන ලබා දෙන ලෙස MOI හරහා රජයේ භාණ්ඩාගාරයෙන් ඉල්ලා ඇත.<br>එහි ප්‍රතිඵලයක් ලෙස මුදල් ප්‍රකාශන සකස් කර ඇත්තේ භාණ්ඩාගාරයෙන් PMU වෙත ලැබුණු අරමුදල් පමණක් පිළිබිඹු වන පරිදිය. එබැවින්, | මූල්‍ය දායකත්වය ලබාදෙන නියෝජිතායතනය විසින් සපයනු ලබන අරමුදල් මහ බැංකුව හරහා යොමු කර ව්‍යාපෘතියේ කාර්යය සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදලට සරිලන පරිදි මූල්‍ය ප්‍රකාශනවල වටිනාකම අමාත්‍යාංශ ලේකම් විසින් සහතික කරනු ලබන අතර, එම පදනමම CDR හි ද පිළිබිඹු වේ. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ ශේෂ පිරික්සුමේ සමුච්චිත අරමුදල් ලෙස රු. මිලියන 65.99 ක හඳුනා නොගත් ණය ශේෂයක් දක්වා තිබුණද, එවැනි ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | මෙම මුදල අපගේ ගිණුම්කරණ පද්ධතිය, ක්වික් බුක්ස් ගිණුම් පැකේජය හරහා ව්‍යාපෘති වටිනාකමට සකස් කර ඇත. ඒ අනුව, අවධානය සඳහා ගිණුමේ උපලේඛනයක් ලබා දෙන ලදී. | මූල්‍ය ප්‍රකාශනවල සියලුම ගනුදෙනු හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | රු.මිලියන 63.60 ට සමාන ඇමෙරිකානු ඩොලර් 203,602.80 ක වටිනාකමින් යුත් අනුමත ණය මුදලින් ලබා නොගත් ප්‍රමාණයට අය කෙරෙන ගාස්තු (Commitment Fee) සහ හිඟ අත්තිකාරම් සම්බන්ධ වගකීම් UNDP විසින් සපයන ලද ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාවට ඇතුළත් කර තිබුණි. කෙසේ වෙතත්, එම ගාස්තු සහ හිඟ අත්තිකාරම් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ වගකීම් හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය. |

**2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම**

| අංකය | නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම/විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති ලේඛනයේ 7 වන කොටසෙහි 69 වන වගන්තිය | ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව (CDR) වාරිමාර්ග අමාත්‍යාංශයේ (ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනයේ) ලේකම් විසින් අනුමත කළ යුතුය. කෙසේ වෙතත්, 2017 සිට 2023 දක්වා කාලය තුළ ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව අනුමත කිරීමේදී ලේකම්වරයා විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අදාළව ඇමෙරිකානු ඩොලර් 17,657,672.68ක වියදම් පමණක් සහතික කර තිබුණි. | විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ඒකාබද්ධ බෙදාහැරීමේ වාර්තාව ලේකම් විසින් අනුමත කළ යුතුය. |
| (ආ) | FAA හි අරමුදල් යෝජනාවේ B කොටස | රු.මිලියන 3,074 (ඇ.ඩොලර් මිලියන 12.98)ක් හරිත දේශගුණික අරමුදලෙන් සහ ශ්‍රී ලංකා රජයෙන් රු.මිලියන 2,141.95 (ඇමරිකානු ඩොලර් මිලියන 8.84) ක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත 2023 වර්ෂය අවසන් වන තෙක් ලැබී තිබුණි.<br><br>FAA හි අරමුදල් යෝජනාවේ B කොටසට අනුව, ශ්‍රී ලංකා රජයේ දායකත්වය සියයට 27 ක් වන අතර GCF හි දායකත්වය | විගණන නිරීක්ෂණ සඳහා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | අරමුදල් යෝජනාවේ කොන්දේසි අනුව ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබෙන මුදල මත පදනම්ව රජයේ දායකත්වය නිදහස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ව්‍යාපෘතියේ මුළු අයවැයෙන් සියයට 73 කි. ව්‍යාපෘතිය සඳහා GCF වෙතින් රු.මිලියන 3,074ක් ලැබී තිබුණද එය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 59ක් පමණි. මේ නිසා ශ්‍රී ලංකා රජය 2017-2023 කාලය තුළ ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 36.6 ට සමාන රු. මිලියන 1,789 ක් වැය කර තිබුණි. | | |
| (ඇ) | FAA හි 2.01 වගන්තිය | ප්‍රතිතනයට ලත් ආයතනය (UNDP) "ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අරමුදල් සපයන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂණය සහ අධීක්ෂණය කළ යුතුය." එම වගන්තිය සැලකිල්ලට නොගෙන, ප්‍රතිතනය ලත් ආයතනය (UNDP) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීමේ නිරත වී තිබූ අතර 2017-2023 කාලය තුල මුළු වියදමෙන් සියයට 51.84 ක් දරන ලද අතර එය රු.මිලියන 3,198 කට සමාන ඇමරිකන් ඩොලර් මිලියන 14.91 ක් වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. සාකච්ඡාවේදී විගණන නිරීක්ෂණ පිළිගෙන තිබුණි. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය විසින් ක්‍රියාත්මක කළ යුතු අතර FAA ප්‍රකාරව ප්‍රතිතනය ලත් නියෝජිතායතනය විසින් සුපරීක්ෂණය සහ අධීක්ෂණය කළ යුතුය. |

## 3 භෞතික කාර්යසාධනය

### 3.1 පද්ධති සහ පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතියේ මූල්‍ය ක්‍රියාකාරකම් ගිවිසුමේ පිරිවැය අයිතම 1E සහ 1K හි පෙන්වා ඇති අයිතමවලට පටහැනිව ගොඩනැගිලි කුලිය රු.482,000ක් සංරචක 1 හි උපකරණ සහ ගෘහ භාණ්ඩ (ගිණුම්කරණ කේත අංක 72200) යටතේ වැය කර තිබුණි. | FAA හි 2 වගුවේ දක්වා ඇති අයවැය කේත සහ විධිවිධාන අනුගමනය කරමින්, 1E අයවැය සටහන් යටතේ කේත අංක 72200 හැර බදුකුලී ගාස්තු සඳහා සුදුසු අයවැය කේතයක් නොමැත. | FAA හි සඳහන් පරිදි වියදම් ගිණුම් ගත කළ යුතුය. |